# වැලිගම් පුරයේ
# ඓතිහාසික ස්ථාන

මහජන පුස්තකාලය

## 2.7 ප්‍රදේශයට අනන්‍ය වූ එකතුවක් ගොඩනැගීම.

වැලිගම මහජන පුස්තකාලයේ ප්‍රදේශයට අනන්‍යවූ පහත සඳහන් එකතුව ගොඩනගා ඇත.

**වැලිගම ඉතිහාසය :-**

වැලිගම ඓතිහාසික තොරතුරු දෙස බැලීමේදී වසර 2300 ක පමණ ලේඛනගත ඉතිහාස කතන්දරයකට නෑකම් කියන ජනාවාසයක් ලෙස වැලිගම පුරවරය හැඳින්විය හැකිය. ක්‍රි.පූ. 3 වන ශත වර්ෂයේ දේවානම් පියතිස්ස රාජ්‍ය යුගයේදී දෙතිස් ඵල රුක බෝධීන් අතුරින් එක් බෝධියක් වැලිගම් වෙහෙරේ රෝපනය කරවීමේ ග්‍රන්ථාගත ප්‍රවෘත්ති අනුව වැලිගම ඉතිහාසය එම යුගය කරා දිව යයි.

වැලිගම් පුරයේ පැවතෙන ඓතිහාසික ස්ථාන වශයෙන් ප්‍රධාන කොටලා සලකන අග්‍රබෝධි විහාරය රාජකුළවඩන විහාරය, තිරුවාන කෝවිල, කුෂ්ඨරාගල, ගංදුව සඳහන් කල හැකිය.

**අග්‍රබෝධි රජ මහා විහාරය.**

මෙම පැරණි රජමහා විහාරය වැලිගම නගර සීමාවේ පිහිටා ඇත. බෝධිවංශය අනුව අනුරාධපුර ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ බෝධි අංකුර 32 න් එකක් මෙහි රෝපණය කර ඇත. රුහුණේ රජකල හතර වැනි අග්ගබෝධි රජතුමාගේ අනුග්‍රහයෙන් වෙහෙර ඉදිකරන ලද නිසා මේ නම ලැබී ඇතැයි විශ්වාසයක් ද පවති. තිසර, පරෙවි, කොවුල් සංදේශ මෙම පැරණි විහාරය විස්තර කරයි. අග්‍රබෝධි විහාරයේ නඩත්තුව සඳහා විශාල බිම් ප්‍රමාණයක් 12 වැනි සියවසේ සිට 15 වන සියවස් වලදී පූජා කරන ලද බව සඳහන් වේ.


ඇල්ගිරි (සාලිගිරි) 12 වැනි සියවසේදී මෙම විහාරයට පූජා කරන ලද ගමයි. අග්‍රබෝධි විහාරය මුළුමනින්ම වාගේ නවීකරණයට භාජනය කරන ලද නිසා එහි පෞරාණික තත්වය දැකගැනීමට ශේෂව ඇත්තේ සාධක කිහිපයක් පමණි. මහනුවර යුගයට අයත් මුල් බුදුරුව විහාරයේ බුදුගෙයි දී දැකගත හැකිය. බෝධිය සහ ස්ථූපයේ පෞරාණික ලක්‍ෂණ දැනට අභාවයට ගොස් ඇත. කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා විසින් පිහිටු වන ලද ශිලා ලේඛන සහ විහාරය අසල ඇති ගල්කණු අතීත පුරාවෘත්තයක ඇති සාධක වේ. පන්සල තුළ පැරණි පුස්කොළ පොත් රාශියක් ඇත. ගලක කොටා ඇති අෂ්ඨ මංගල සලකුණු සහිත (අටමගල) සංකේතය පෞරාණික බව කියාපාන තවත් සාධකයකි. එය අනුරාධපුර යුගය හා අග්‍රබෝධි විහාරය එක යුගයක ආරම්භයක් බව ප්‍රබල සාක්‍ෂියකි.



**රාජකුලවඩන රජමහා විහාරය.**


වැලිගම නගර සීමාව තුළ පිහිටි මෙම විහාරය, ශ්‍රී මහා බෝධියේ අංකුරයක් රෝපනය කරන ලද, අග්‍රබෝධි විහාර පද්ධතියේම කොටසක් විය. දැනට එය වෙනම විහාරයක් ලෙස පවත්වාගෙන යනු ලැබේ. මෙහි ආරම්භය අනුරාධපුරය දක්වා විහිදේ. මහාවංශයේ සහ කෝකිල සංදේශයේ මෙම විහාරය ගැන සඳහනක් දැක්වේ. මිහිඳු මාහිමියන්ගේ වැඩමවීම සිහිකිරීම සඳහා සෑම අවුරුද්දකම පාසා ජූනි මාසයේ මෙහි පොසොන් පෙරහරක් පැවැත්වේ.

ඉතිහාසයේ වැලිගම් වෙහෙර වූ මෙය පසුව නිකාය බේදයන් මත වෙන් විය. රාජකුලවඩන නැමති සෙනවියෙකු මෙය මහා පිරිවෙණක් බවට පත් කල බවද, ඉතිහාසයේ දැක්වේ. පැරණි වැලිගම් වෙහෙරේ ස්වාමීන් වහන්සේලා වැඩසිටි භූමිය ද මෙය වන බව ඉතිහාසයේ සඳහන් වන බවද, මෙයට යාබඳ වැලිගම්ගනේ පන්සල ද ඇත. එහි අර්ථය නම් වැලිගම ගනයා විසූ තැනයි. ගනය යනුවෙන් නම්කලේ අප බෞද්ධ ස්වාමීන් වහන්සේලාය.



## පෙර තිරුවාල කෝවිල අද බෝධිමළු විහාරය.


අතීතයේ දඹදෙනි රාජධානිය වැනි යුගයකදී ඉදිවී ඇතැයි සැළකෙන ඓතිහාසික තිරුවානා කෝවිල වැලිගම නගර මධ්‍යයේ පිහිටි ඉපැරණි සිද්ධස්ථානයකි. මෙවන් ඓතිහාසික වැදගත්කමකින් යුත් තිරුවාල කෝවිලේ ස්වර්ණමය යුගය ලෙස සැලකෙන්නේ කෝට්ටේ යුගයයි. එම යුගයේදී රචිත සංදේශ කාව්‍යයන් කිහිපයකම වැලිගම පුරවරය පිළිබඳ තොරතුරු සඳහන් වීමත් කෝකිල සංදේශයේදී මෙම ඓතිහාසික තිරුවාල කෝවිල පිළිබඳ තොරතුරු හමුවීමක් මෙහි ඇත. ඓතිහාසික බවට කදිම සාධකයකි.



## හෙට්ටිවීදිය පල්ලිය.

1814 දී වැස්ලියන් මෙතෝදිස්ත නිකායට අයත් ජෝජ් අර්කින් හා ඔල්ට් යන මිෂනාරි පූජ්‍ය දෙපළ 1914 ජුනි 30 වැනිදා වැලිගම් වරායෙන් ලංකාවට පැමිණි බව වැලිගම හෙට්ටිවීදියේ ඉදිකල පල්ලියේ ඇති ශිලා ලේඛනයේ සඳහන් වේ. මොවුන් ආසියාවට පැමිණි ප්‍රථම මිෂනාරි කණ්ඩායම බවද හෙළිවී ඇත.


19 වන ශත වර්ෂය මුල්භාගය වන විට වැලිගම මිෂනාරී බලය තහවුරු වී ඇත.



## දේවස්ථාන


### කජ්පරතොට පල්ලිය.

මුස්ලිම් සාන්තුවරයෙකුගේ සොහොනක් පිහිටි කජ්පරතොට මුස්ලිම් පල්ලිය සහ සිංහල බැතිමතුන් අනුග්‍රහ දක්වන සිද්ධස්ථානයකි. සිංහල හා මුස්ලිම් ජනතාවගේ සමගිය විදහා දක්වන දුර්ලභ ගණයේ සිද්ධස්ථානයකි.



ගංදූව.

සුන්දර වැලිගම් බොක්ක තුළ පිහිටා ඇති කුඩා දිවයින ගංදූව, තැප්‍රොබේන් අයිලන්ඩ් ග්‍රවුන් ඩී මොනි යන නම්වලින් විවිධ අය හඳුන්වයි. මෙම දූපත මැද ඉතා පෞරාණික සුවිශේෂ ගෘහ නිර්මාණ ලක්ෂණ පිරි ගොඩනැගිල්ලක් ඇත.




## කුෂ්ධරාජගල

අග්‍රබෝධි විහාරයට ඉතා ආසන්නයේ වැලිගම නගර සභා සීමාව තුළ කුෂ්ධරාජගල පිළිරුව නෙළා ඇත.

අවලෝකේතිශ්වර බෝධින් වහන්සේගේ පිළිරුව ලංකාව තුළ සොයා ගන්නා ලද ඉතාම දැකුම්කළු මහායාන පිළිරුවකි. මෙම පිළිරුවේ සහ එහි ඉදිකිරීම් පිළිබඳව වෘතාන්ත රාශියක් ඇත. මෙයින් ඉතා ජනප්‍රිය වෘතාන්තය වී ඇත්තේ, මේ ස්ථානයේදී තමන්ට වැළඳී තිබූ හමේ රෝගයක් සුවකර ගැනීම නිසා රජකුමරෙකු විසින් එය කරන ලද බවයි. එම කතාවේ සත්‍යතාව තවත් කාරණයකින් පැහැදිලි වනු ඇත. වැලිගම පැරණි වරායකි. ඉන්දියාවේ කිලක්කාරේ විසූ රජකෙනෙකු ඔහුට වැළඳී තිබූ සමේ රෝගයක් සුවකර ගැනීම පිණිස වැලිගම අග්‍රබෝධි විහාරයට වන්දනාවක් සඳහා පැමිණ තමාගේ රෝගය සුව වුවහොත් පුද පූජා පවත්වන බවට විෂ්ණු දෙවියන්ට භාර වී ඇති බවය. තමන්ගේ රෝගය සුවවීමෙන් පසු භාරය ඔප්පු කිරීම පිණිස මෙම ගලේ පිළිමය නෙළා ඇත.

මෙම පිළිමය වැලිගම ඉතිහාසයේ ප්‍රතිමූර්තියකි. ආගමික භේදයකින් තොරව වන්දනීය වූ පිළිමයක් ලෙස හැඳින්වේ.



# 23 වැලිගම කුෂ්ටරාජගල බෝධිසත්ත්ව ප්‍රතිමාව

ඉතිහාසයේ ආරම්භයේ සිටම මෙම දිවයිනේ වැදගත්කමකින් යුත් ප්‍රදේශයක ලෙස රෝහණ රාජ්‍යය පැවතිණ. පුරාණ අවධියේ දී අනුරාධපුරයට පමණක් රෝහණය දෙවෙනි විය. විශේෂයෙන්ම අතීත පාලකයා ස්වකීය දේශපාලන රැකවරණය ලබ ගැනීමේදී රෝහණය වැදගත් වේ. ශ්‍රේෂ්ඨ ඉතිහාසයක් ඇති මෙහි වැදගත් ලක්ෂණය වන්නේ ආගමික වශයෙන් වැදගත් ස්ථාන ගණනාවක් බිහිවීමයි.

මාතර දිස්ත්‍රික්කයේ වැලිගම නගරය අසල පිහිටා ඇති වැදගත් ස්ථානයකි කුෂ්ටරාජගල. මාතර සිට සැතපුම් දොළහක් පමණ කොළඹ දෙසට ගමන් කරන්නෙකුට වම්පස පිහිටා ඇති ගල් පර්වතයක ශෛලමය ප්‍රතිමාවක් දක්නට ඇත. "කුෂ්ටරජා ලෙස හඳුන්වන්නේ ජනප්‍රවාදයට අනුවය. අනුරපුර යුගයේ මෑත භාගයෙහි ඉදිකරන ල මෙම ප්‍රතිමාව එවකට රෝහණ රාජ්‍යයේ ඈත දුරබැහැර බටහිර සීමාවට ආසන්නව පිහිටි නිර්මාණයකි.

මෙම ප්‍රතිමාව පිහිටා ඇති වැලිගම ප්‍රදේශය ඉපැරණි ඉතිහාසයකට උරුමකම් කියයි. ශ්‍රී මහා බෝධියෙන් හටගත් දෙතිස් ඵල බෝධීන්ගෙන් එකක් වැලිගම අග්‍රබෝධි විහාරයේ රෝපණය කර ඇති බව පැවසේ. තවද වැලිගම පැරණි වරායක් වශයෙන් පැවති වීම නිසා ආර්ථික වැදගත්කම සහ විදේශ සම්බන්ධතා සම්බන්ධයෙන් ද මෙම ප්‍රදේශය වැදගත් වේ. වසභ රජු වල්ලියේර විහාරයේ තෙරුණ් කෙරෙහි පැහැදී ඉදිකළ නිසා වල්ලිගෝත්‍ර විහාරය වැලිගම ඉදි කරන ලදැයි විශ්වාස කෙරේ. පොළොන්නරු යුගයේ පළමු පැරකුම් රාජ්‍ය සමයේ ධනවත් ද්‍රවිඩ ජනයා මෙහි වාසය කළහ.

මෙම විහාරයේ ආරම්භය සම්බන්ධයෙන් ජනප්‍රවාද ගණනාවක් පවතී. වැලිගමට ගොඩබට කුෂ්ට රෝගයකින් පීඩා විඳිනු ලැබූ රජෙකු මෙහි විසූ දේශීය වෛද්‍යවරයෙකුගෙන් ප්‍රතිකාර ලබා සුවපත් විය. එම රජු සිහිවීම පිණිස ඔහුගේ පිළිරුවක් මෙම පර්වතයෙහි තෙළන ලද බවත්, එනිසා එම ප්‍රතිමාව කුෂ්ටරාජ ලෙස හැඳින් වූ බවත් ජනප්‍රවාදයේ පවතී. ඇතැම් අයගේ මතය වන්නේ කුෂ්ට රෝගයක් වැළඳී රජෙක වැලිගම අග්‍රබෝධි විහාරයට ඇපයක් වූ බවත් එය සුවපත් වීමෙන් පසු ඇප වූ දෙවියන්ගේ රූපය මෙහි නිර්මාණය කළ බවත්ය.

මෙම ප්‍රතිමාව දෙස බැලීමෙන් අවබෝධ වන්නේ රජ කෙනෙකුගේ විලාසය පෙන්වන බවකි. එහෙත් එහි ජටාමකුටයේ අමිතාභ ධ්‍යානි බුදුන්ගේ බුදුරූ හතරක් ඇත නම් නිසා එය රජරුවක් ලෙස පිළිගත නොහැක. මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා පෙන්වා දෙන්නේ ඉන් නිරූපණය වන්නේ මහායාන බුදුසමයේ සඳහන් වන සමන්තභද්‍ර නම් බුදුන් බවයි. එහෙත් මහාචාර්ය ප්‍රේමතිලක මහතාගේ මතය වන්නේ එය අවලෝකිතේශ්වර බෝධි සත්ත්වයන් බවයි. ඇතැම් අය නාථ දෙවියන් ලෙස සලකා වැඳුම් පිදුම් කරණු ලැබේ. ඇතැමුන් මේ කල්පයේ බුදුවන මෛත්‍රී බෝධිසත්ත්වයන් ලෙස සලකා වැඳුම් පිදුම් කරනු ලැබේ. මෙම පිළිගැනීම පිළිබඳ පරස්පර විරෝධී මතයන් ද ඇත. නාථ හා මෛත්‍රී දෙදෙනෙකු ලෙස සැලකීමට සිදුවන සාධක ද ඇත. රන්ගිරි දඹුලු විහාර විස්තරය, අස්ගිරි විහාර ලිපිය, පැපිලියානේ සෙල්ලිපි ආදිය මඟින් හඳුනාගැ ලැබෙන්නේ නාථ හා මෛත්‍රී දෙදෙනෙකු ලෙසය. ඉන් පසක් වන්නේ අන් කිසිවෙකු නොව බුදුසමයෙහි (මහායාන බුදුදහම) ඉතාමත් ජනප්‍රිය වූ අවලෝකිතේශ්ව

බෝධිසත්ත්වයන් බවයි. ලෝකේශ්වර යනුවෙන් අදහස් වනුයේ ලොවටම ඉසුරුමතා හෝ ලොවට අධිපතියා වශයෙනි.

කුෂ්ටරාජගල පිළිබඳව තොරතුරු සඳහන් වන ඓතිහාසික මූලාශ්‍ර සීමාසහිතය. එහෙත් අවලෝකිතේශ්වර බෝසතුන් ලක්දිවට ප්‍රධාන දෙවිවරුන්ගේ ස්වරූපයෙන් පෙනී සිටි අවස්ථා වාර්තා වන නිසා මෙම ස්ථානය මුල් කාලවල සිටම පුද පූජාවට පාත්‍ර වූවාට සැක නැත. ක්‍රි.ව. 7 වන හෝ 9 වන සියවස් අතර කාලයට අයත් නිර්මාණ ලක්ෂණ බොහෝ දුරට මෙම ප්‍රතිමාවෙහි විද්‍යමාන වේ. ලංකාවේ බෝධිසත්ත්ව ප්‍රතිමා නිර්මාණය කවදා සිදුවූවාද යන්න පැහැදිලි නැතත් මෙහි එම යුගයන්ට අයත් ලක්ෂණ විද්‍යමාන වේ. මහාවංශයට අනුව මහසෙන් රජුගේ පුත්‍රයකු වූ ජෙට්ඨතිස්ස සෘද්ධියෙන් බෝසත් රුවක් මවා ඇත. ඉන්දියාවේ මෙම නිර්මාණ ක්‍රි.ව. 3 වන සියවසේ සිට නිර්මාණ කිරීමට පටන් ගෙන ඇත.

මෙම ස්ථානයේ ප්‍රතිමා දෙකක් දක්නට ලැබේ. ඉන් එකක් බෝධිසත්ත්ව ප්‍රතිමාවකි. මේවායේ නිර්මාණකරුවන් ලෙස පළමු දප්පුල සහ අග්‍රබෝධි රජ හඳුනාගෙන ඇත. I වන දප්පුල විසින් පහළොස් රියන් බුදුරුවක් කළ බව සඳහන් වේ. එය කුමක්දැයි මේ වන විට හඳුනා[illegible]ැත. දාඨෝපතිස්ස රජුගෙන් බේරී රුහුණට පැමිණි ඔහු තම රාජ්‍ය මධ්‍යස්ථානය ව[illegible]යෙන දෙවිනුවර තෝරා ගත්තේය. අනුරාධපුර යුගයේ අවසාන භාගයේ රුහුණේ කීර්තිමත් පාලකයා මොහුය. මහාවංශයෙහි සඳහන් කරුණුවලට අනුව වැලිගම කුෂ්ටරාජගල ප්‍රතිමාව දප්පුල රජුගේ අවසාන කාලයේ දී ඉදිවූ බවට අනුමාන කළ හැකිය.

දකුණු පළාතේ පිහිටි ඉතා වැදගත් වූද සුවිශේෂී කුෂ්ටරාජගල අවලෝකිතේශ්වර නාථ ප්‍රතිමාව පිළිබඳ මුල්කාලීන ඓතිහාසික කෘතිවල පැහැදිලිව සඳහන්ව නොතිබීම විමසිය යුතුය. ඒ පිළිබඳ ජනප්‍රවාද කිහිපයකට සීමා වී පවතී. වැලිගම ප්‍රතිමාව ආරම්භයේ සිට සිංහල රජුන්ගේ අනුග්‍රහයට ලක්නොවූ බව පෙනේ. දකුණේ ඉතාමත් වැදගත් විද්‍යස්ථානා දෙකක් වූ දෙවිනුවර පිහිටි සේලන්තර මූලයට අයත් ඉරුගල්කුලතිලක පිරිවෙනත්, තොටගමුවේ පිහිටි උත්තර මූලයට අයත් විජයබා පිරිවෙනත් ඇසුරු කළ යතිවරු උත්පලවණ්ණ සහ නාථ දෙවියන් තම කෘතිවල වර්ණනා කර ඇත. නමුත් එම ග්‍රන්ථකරණයේදී මෙම ප්‍රතිමාව හුදකලා විය. මුස්ලිම් හා පෘතුගීසි බලපෑම් නිසා මෙම ස්ථානය තවදුරටත් හුදකලා විය. සිංහල රාජධානි නිරිත දිගට සංක්‍රමණය වීමත් සමග මෙහි හුදකලා භාවය තවදුරටත් වැඩි වූ බව පෙනේ.

කෙසේ වුවත් ඉතා වැදගත් වූද, සුවිශේෂී වූද කුෂ්ටරාජගල අවලෝකිතේශ්වර නාථ ප්‍රතිමාව විශිෂ්ට නිර්මාණයකි.